# ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක්

එස්.පී.ඩී. සංජීවනී1

**සංක්ෂේපය**

1970 අග භාගයේ සිට රැකියා සඳහා විදේශ ගතවීම සීග්‍රයෙන් ඉහළ යාමට පටන් ගත් අතර ඒ සඳහා විවිධ ආර්ථික, දේශපාලන, සාමාජීය හේතු බලපාන ලදී. ශ්‍රී ලංකාව තුළ විරැකියා මට්ටම අඩු වීමට මෙන් ම විදේශ විනිමය ලැබීම් ඉහළ යාමට වැදගත් දායකත්වයක් දක්වනුයේ විදේශ සේවා නියුක්තිකයින් ය. ඒ නිසා ශ්‍රීලංකාවේ ආර්ථිකයේ වැදගත් ස්ථානයක් විදේශ සේවා නියුක්තිකයින්ට හිමි වේ. 80 දශකයේ මැද භාගය වන විට මැද පෙරදිග ගෘහ සේවිකා රැකියා සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයින්ට ඉහළ ඉල්ලුමක් පැවති අතර බොහෝ අපහසුතාවන්ගෙන් යුත් කුටුම්භයන් වඩාත් යහපත් අනාගතයක් උදෙසා වන අරමුණෙන් යුතුව විවිධ කැප කිරීම් සිදු කරමින් විදේශ ගත වන්නට විය. මෙලෙස පවුලේ මව ප්‍රධාන වශයෙන් ම විදේශ ගත වීම හේතු කොටගෙන එම ගෘහ ඒකක තුළ මෙන් ම ඒ හා බැඳුණු නවතාවකින් යුත් සාමාජීය මෙන් ම ආර්ථික තත්ත්වයන් වර්ධනය විය. මෙම ලිපියෙහි අවධානය යොමු කරන්නේ මෙලෙස කාන්තා සංක්‍රමණික තත්ත්වයන් හේතු කොට ගෙන ඇතිවනු ලැබූ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳවයි.

**මුඛ්‍ය පදඃ** විදේශ රැකියා, ශ්‍රී ලංකාව, මැද පෙරදිග ගෘහ සේවිකා රැකියා, කාන්තා සංක්‍රමණ, ආර්ථිකය

## හැඳින්වීම

1970 අග භාගයේ සිට වර්ථමානය දක්වාම ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණ මට්ටම ඉතා සීග්‍රයෙන් ඉහල යමින් පවතී. 70 දශකයේ මුල් භාගයේදී මෙරට ඉහල අධ්‍යාපනයක් ලැබූ වෘත්තිකයන් රට හැර යාමේ ප්‍රවණතාවයක් පැවති අතර 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමඟ ම නුපුහුණු ශ්‍රමිකයින් සඳහා ද විදේශ රැකියා දොරටු විවෘත විය. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට පෙර සංවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් හෙම්බත් වී සිටි මෙරට මෙරට මධ්‍යම පාංතික පවුල් වලට සහ දිළිඳු පවුල් වලට මෙය මහගු අවස්ථාවක් විය. මෙම කාලයේදීම මැද පෙරදිග ගෘහ සේවිකාවන් සඳහා ඉතා ඉහල ඉල්ලුමක් පැවති අතර ඒ සඳහා විශේෂ පුහුණුවක් අවශ්‍යය නොවීය. 1977 දී රැකියා සඳහා විදේශ ගත වූ මුළු ශ්‍රමිකයින්ගෙන් ස්ත්‍රී ප්‍රතිශතය වූයේ සියයට 4ක් පමණි. 1987 වන විට එය සියයට 34 දක්වා වර්ධනය වූ අතර 1997 දී සංක්‍රමණ ස්ත්‍රී ප්‍රතිශතය මුළු සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් සියයට 75 කි. නමුත් 1998 දී ශ්‍රී ලංකාවේ සංක්‍රමණික කාන්තා ප්‍රතිශතයේ තරමක පහල බැසීමක් පෙන්නුම් කරයි. 1998 දී සංක්‍රමණික කාන්තා ප්‍රතිශතය සියයට 66.3 කි. (සංක්‍රමණිකයන් පිළිබඳ අත් පොත 2002) එය ලංකාවේ ඉහලම කාන්තා ශ්‍රම සංක්‍රමණ ප්‍රතිශතය වන සියයට 75 ක් වාර්තා වූ 1997 වර්ෂයට වඩා සියයට 9 ක්

---

1 ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර,spdsjayarathna@gmail.com

පමණ පහල බැසීමකි. නැවත 2001 වන විට එය 67.5 දක්වා වර්ධනය විය. කෙසේ වුවද 1998 න් පසු ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණ ප්‍රතිශතයේ පැහැදිළි පහල බැසීමක් හෝ ඉහල නැගීමක් දැකිය නොහැකිය. 1998න් පසු සියයට 65ත් සියයට 68ත් අතර මට්ටමක උච්චාවචනය වෙමින් පැවති අතර 2005 දී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණ ප්‍රතිශතය සියයට 65 කි.

1.1. වගුව: ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංක්‍රමණික ශ්‍රමිකයින් සංඛ්‍යාව

| වර්ෂය | පුරුෂ | ස්ත්‍රී | ස්ත්‍රී ප්‍රතිශතය |
|---|---|---|---|
| 1972 | 1680 | 25 | 1.4 |
| 1977 | 5402 | 231 | 4.0 |
| 1982 | 17069 | 5381 | 24.0 |
| 1987 | 10647 | 5480 | 34.0 |
| 1992 | 15497 | 29159 | 65.0 |
| 1999 | 37552 | 112732 | 75.0 |
| 2002 | 70726 | 132984 | 65.0 |
| 2005 | 80710 | 111778 | 55.3 |
| 2007 | 102629 | 114677 | 52.77 |
| 2008 | 123490 | 123490 | 48.0 |
| 2009 | 128530 | 127843 | 51.73 |
| 2010 | 135502 | 130946 | 49.1 |

මූලාශ්‍රය: සංක්‍රමණිකයන් පිළිබඳ සංඛ්‍යා අත් පොත් විදේශ සේවා නියුක්ති කාර්යංශය

1999 වර්ෂයේ රැකියා සඳහා විදේශ ගත වූ කාන්තාවන්ගෙන් සියයට 75ක් ම ගෘහ සේවිකා වෘත්තිය සඳහා සංක්‍රමණය වූවන්ය. (විදේශ සේවා නියුක්ති කාර්යංශය 1999) එයට හේතුව වන්නේ ගෘහ සේවිකා වෘත්තිය සඳහා සවුදි අරාබිය ඇතුළු අනෙකුත් මැද පෙරදිග රට වලින් ඉහල ඉල්ලුමක් පැවතීමත් , ඒ සඳහා විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවීමත් , සංක්‍රමණය වීමට එතරම් විශාල මූලික මුදලක් වැය නොකළයුතු වීමත් ය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සංඛ්‍යා ලේඛණ

වලට අනුව 2005 වර්ෂයේ රැකියා සඳහා සිදු වූ මුළු සංක්‍රමණ වලින් සියයට 95ක්ම මැද පෙරදිග රටවල් සඳහා සිදු වූ සංක්‍රමණයන්ය. එයින් සියයට 35ක් ම පමණ වූ ඉහලම සංක්‍රමණයන් සිදු වී ඇත්තේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේයි. කුවේට් රාජ්‍යයට සියයට 20.5 ක සංක්‍රමණයක් සිදු වී ඇති අතර අඩුම පුද්ගලයන් සංඛ්‍යාවක් සංක්‍රමණය වී ඇත්තේ පකිස්ථානය, එක්සත් රාජධානිය, සිරියාව සහ අප්‍රිකාව වැනි රට වලට ය.

**සංක්‍රමණික කාන්තාවන්ගේ සමාජ ආර්ථික ගති ලක්ෂණ**

මැද පෙරදිග ගෘහ සේවිකා වෘත්තිය සඳහා පිටවන කාන්තාවන්ගේ බහුතරය ඉතා දිළිඳු පවුල් වල අය වන අතර ඔවුහු අඩු අධ්‍යාපන මට්ටමක් ලැබුවෝ වෙති. සාමාන්‍යයෙන් ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය වන්නේ වයස අවුරුදු 18ත් 45ත් අතර කාන්තාවන් ය. ඒ අය අතරින් සියයට 75ක් ම පමණ විවාහක දරුවන් සිටින මව්වරුන් වන අතර ඇතැම්හු කුඩා බිළිඳුන් සිටින මව්වරුන් ද වෙති. 1999 දී ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය මඟින් පැවැත් වූ සමීක්ෂණයකට අනුව මැද පෙරදිග යන කාන්තාවන්ගෙන් සියයට 58ක් පමණ දෙනා මසකට රුපියල් 1000 ට වඩා අඩු ආදායම් ලබන පවුල් වල අය වෙති. එමෙන්ම මෙම පවුල් වල අඩුම වශයෙන් යැපෙන්නන් තිදෙනෙක්වත් සිටී.

**ශ්‍රම සංක්‍රමණ හා එවරට් ලී න්‍යාය**

ප්‍රජා විද්‍යාඥයකු වන එවරට් ලී (1966) ගේ සංක්‍රමණ න්‍යායට අනුව සංක්‍රමණය වීමේ තීරණය කෙරෙහි බලපාන සාධක සහ සංක්‍රමණ ක්‍රියාවලිය ශීර්ෂ 4ක් යටතේ සම්පිණ්ඩනය කරනු ලැබේ. ඒවා නම් ,

- ආරම්භක ප්‍රදේශය හා සම්බන්ධ සාධක
- ගමනාන්ත ප්‍රදේශය හා සම්බන්ධ සාධක
- මැදිහත් වන බාධක (අතරමැදි බාධක)
- පෞද්ගලික සාධක

වශයෙනි. එසේ ම ලී න්‍යායට අනුව කිසියම් සංක්‍රමණයක් සිදු වීම කෙරෙහි ප්‍රධාන සාධක 2ක් බලපානු ලබයි. ඉන් පළමුවැන්න තමා දැනට ජීවත් වන ප්‍රදේශයේ තම අරමුණු ඉටු කර ගැනීමට බාධා පමුණුවන සාධක වන තල්ලු කිරීමේ සාධකයයි. (push factors) දෙවැන්න සංක්‍රමණය වීමට බලාපොරොත්තු වන ප්‍රදේශයේ ඇති තම අරමුණ ඉටු කර ගැනීමට දිරි දෙන සාධක වන ඇද ගැනීමේ සාධකයයි. (pull factors) කාන්තා ශ්‍රම සංක්‍රමණ සම්බන්ධයෙන් ලී ගේ න්‍යායේ ප්‍රායෝගිකත්වය සළකා බැලුවහොත් ප්‍රධානතම තල්ලු කිරීමේ සාධකය ලෙස සැළකිය හැකි වන්නේ ආර්ථික විෂමතාවයයි. මීට අමතරව ශ්‍රී ලංකා රජය ශ්‍රම සංක්‍රමණ දිරි ගන්වන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත්, අඩු වැටුප්, සේවක තෘප්තියක් ලබා ගැනීමට නොහැකි වීම, ශිල්පීය සහ අධ්‍යාපන කුසලතාවන් වැඩි දියුණු කර ගැනීමට නොහැකි වීම, සමාජ/දේශපාලන හේතුන්, ආයෝජනය කිරීමට තරම් මනා පසුබිමක් නොමැති වීම යනාදිය ප්‍රධාන තල්ලු කිරීමේ සාධකයි. ඇද ගැනීමේ සාධක පිළිබඳ අවධානය යොමු

කිරීමේදී තල්ලු සාධකයන්හි ප්‍රති විරුද්ධ ලක්ෂණ මෙහිදී හඳුනා ගත හැකි බව පෙනේ. එනම් රැකියා අවස්ථාවන් බහුල වීම, වැඩි වැටුප්, මනා සේවක තෘප්තියක් ලබා ගත හැකි වීම, ශිල්පීය සහ අධ්‍යාපන කුසලතාවන් වැඩි දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්ථා බහුල වීම, සමාජ/දේශපාලන වශයෙන් යහපත් පසු බිමක් ගොඩ නැගී තිබීම සහ ආයෝජනය කිරීමට තරම් මනා පසු බිමක් ගොඩ නැගී තිබීම යනාදී සාධක මෙහිදී වැදගත් වේ. මේ අනුව සමස්ථයක් ලෙස මැද පෙරදිග රට වල පවතින්නා වූ ශ්‍රම හිඟය ප්‍රධාන ඇද ගැනීමේ සාධකය ලෙස දැක්විය හැකිය.

එවරට් ලී ට අනුව සංක්‍රමණය වීම කෙරෙහි අතරමැදි බාධක බල පෑ හැකිය. එනම් තමන් උපන් ප්‍රදේශයේ සිට සංක්‍රමණික ස්ථානයට ඇති දුර ප්‍රමාණය, ප්‍රවාහන පහසුකම්, සංක්‍රමණය වීමට දැරිය යුතු ඉහල මූල්‍යමය පිරිවැය ආදිය යි. එහෙත් ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් සමඟ ගමනාගමනය හා සන්නිවේදනය දියුණු වූ අතර විදේශ රට වලට සංක්‍රමණය වීමට අවශ්‍ය මුදල්, වැටුපෙන් අඩු කර ගැනීමේ ක්‍රමය මත ගෙවීමට හැකි වීම නිසා මූල්‍යමය පිරිවැය අවම විය. මේ නිසා සංක්‍රමණය බිඳ වැටීම සඳහා බල පෑ හැකි අතරමැදි බාධක බොහෝ දුරට ඉවත් වූ බැවින් ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණය වසරින් වසර ඉහල යන්නට විය.

**සමාජ හා ආර්ථික ප්‍රතිලාභ**

ශ්‍රී ලාංකීය දිළිඳු පවුල් වල ආර්ථික තත්ත්වය දියුණු කිරීමේහිලා කාන්තාවන්ගේ ශ්‍රම සංක්‍රමණය ඉතා විශාල මෙහෙවරක් සිදු කර ඇත. දිළිඳු පවුල් වල විරැකියාවෙන් පීඩිත වූ කාන්තාවන්ට මැද පෙරදිග රැකියා අවස්ථාවන් ලැබීම නිසා ඍජුවම ශ්‍රී ලංකාවේ ශ්‍රම අතිරික්තය උකහා ගැනීමේ නව යාන්ත්‍රණයක් බිහි විය. මේ නිසා කාන්තාවගේ ආර්ථික තත්ත්වය ඉහල නංවුණු අතර ඇයට එම මුදල් මවක, දියණියක හෝ බිරිඳක වශයෙන් තම පවුලේ ආර්ථික වර්ධනය නංවාලීමට යොදා ගැනීමට හැකි විය. විශේෂයෙන්ම රට රැකියා වලින් කරනු ලබන ඉතිරි කිරීම් මගින් ස්වයං රැකියා ආරම්භ කිරීම, කුඩා ව්‍යාපාර ඇති කිරීම ආදී නව ආර්ථික මං පෙත් බිහි වූඅතර එමගින් විදේශ ගතවන කාන්තාවන්ගේ පවුල් වල අයට ද වක්‍ර ලෙස රැකියා මාර්ග උදා විය. මීට අමතරව සාම්ප්‍රදායික කාන්තා සමාජ කාර්යභාරය ඉක්මවා පවුලේ ආර්ථිකයට සක්‍රීය ලෙස දායක වන්නියක වීමට ඇයට අවස්ථාව ලැබුණි. මේ නිසා හුදෙක් කාන්තාවන් තම දරුවන් බිහි කිරීමත්, ඔවුන් පෝෂණය කරමින් රැක බලා ගැනීමත්, තම ස්වාමියාගේ යුතුකම් ඉටු කිරීමත් යන පටු පරමාර්ථ වලින් දුරස් වීම තුළ කාන්තාවගේ තත්ත්වය වඩාත් ඉහල නැංවුණු අතර ආර්ථිකමය ශක්‍යතාවය නිසා ඇයට පෙරට වඩා සමාජ පිළිගැනීමක් සහ ගරු කිරීමක් හිමි විය. මේ නිසාම පවුලේ කටයුතු සම්බන්ධ තීරණ ගැනීමේදී ශක්‍රීය ලෙස දායක වීමට ඇයට ද අවකාශ සැළසුණි. එමෙන්ම බිරිඳක සහ මවක ලෙස කාන්තාව සිය මව්බිමේදී කළ ගෘහ කටයුතු සඳහා මිලක් නොලැබුණු අතර එතෙරදී ඒ සඳහා මූල්‍යමය වටිනාකමක් ලැබීම නිසා තම හැකියාවන් පිළිබඳ ඇයට ආත්මාභිමානයක් ඇති වේ. මෙය කාන්තාවගේ සමාජ තත්ත්වයේ පැහැදිළි වර්ධනයකි.

සංක්‍රමණය වන බොහෝ කාන්තාවන්ගේ අභිලාශය වන්නේ සිය වසර දෙකක සේවා කාලයෙන් පසු පෙරලා සිය රටට පැමිණ තමන්ගේ හිමිකමට නතු වූ නිවසක් ඉදි කර ගැනීම ය. ඇතැම්හු මෙම අභියෝගය ජය ගනිති. මේ නිසා ලංකාවේ බොහෝ දිළිඳු පවුල් වල ස්ථාවර වත්කම් ඉහල නැංවුණු අතර පුරවැසියන්ගේ මූලික අවශ්‍යතා වලින් එකක් වන නිවාස ප්‍රශ්නය සඳහා සෘජු විසඳුම් ලැබීමෙන් රජයේ සුභසාධන වියදම් අඩු කර ගැනීමට ද හැකි විය. කාන්තා ශ්‍රම සංක්‍රමණිකයින් හරහා මෙරටට ගලා එන විදේශ විනිමය මඟින් ජාතික ආදායමට ධනාත්මක බලපෑමක් ඇති කරන අතර මෙරට ගෙවුම් ශේෂය කෙරෙහි වාසිදායක බලපෑමක් ඇති කරයි. විශේෂයෙන්ම එතෙර යන කාන්තාවන්ගේ ඉතුරුම් මෙරට රාජ්‍ය හා පෞද්ගලික බැංකු වල මූල්‍ය තැන්පතු ඉහල නැංවීමට දායක වෙති. එමඟින් රටේ බැංකු ක්‍රමයේ දියුණුවක් ඇති වන අතරම රාජ්‍ය හා පෞද්ගලික බැංකු වලට ණය මැවීමේ හැකියාව කිහිප ගුණයකින් වැඩි වී එම බැංකු වලට දේශීය ආයෝජකයන් සඳහා වැඩි වැඩියෙන් ණය ලබා දීමට ද හැකියාවක් ලැබේ.

විදේශ රැකියා සඳහා මැද පෙරදිග යන කාන්තා සංක්‍රමණිකයින්ගේ පෞද්ගලික ප්‍රේෂණ පිළිබඳ සළකා බලන විට 1991 වසරේදී බිලියන 09ක් වූ මැද පෙරදිග සංක්‍රමණිකයන්ගේ ප්‍රේෂණ 1999 වන විට රුපියල් බිලියන 45 දක්වා ඉහල නැං වී තිබෙන අතර එය 2006 වන විට රුපියල් බිලියන 128282 දක්වා ඉහල ගොස් ඇත. මෙසේ වසර 14ක් වැනි කෙටි කාලයක් තුළදී බිලියන 150000ක පමණ මුදලකින් සංක්‍රමණිකයන්ගේ පෞද්ගලික ප්‍රේෂණ ඉහල යාම මෙරට ආර්ථිකයට ඉතා වාසි සහගත ලෙස බලපෑම් කරයි. (සංක්‍රමණිකයින් පිළිබඳ අත් පොත,2007 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යංශය)

රට රැකියා සඳහා යන බොහෝ ග්‍රාමීය කතුන්ගේ සමාජ දැනුම අල්ප වන අතර ඇතැම් කාන්තාවන් තම විදේශ ගමන් බලපත්‍රය හෝ වීසා ලබා ගැනීම සඳහා කොළඹට පැමිණෙනුයේ ජීවිතයේ ප්‍රථම වතාවටය. (Fernando 1989) නමුත් විදේශ රැකියා සඳහා යාම නිසා ඔවුන්ට ඉතා පුළුල්ව නවීන තාක්ෂණික මෙවලම් භාවිතා කර නව සමාජ ආර්ථික වටපිටාවක් හඳුනා ගැනීමට ඉඩ ලැබෙන අතර මෙයින් රට තොට පිළිබඳ ග්‍රාමීය කාන්තාවගේ දැනුම වර්ධනය වේ.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය අඩු වීම කෙරෙහි ද කාන්තා ශ්‍රම සංක්‍රමණය වක්‍ර ලෙෂ සහයෝගීතාව දක්වයි. ලංකාවේ 1975 වර්ෂයේ 36ක් වූ මුළු සාපල්‍යතා අනුපාතය වසර 2006 වන විට -0.54ක් දක්වා පහත බැස ඇත. සංක්‍රමණික කාන්තාවන්ගේ සියයට 75ක් පමණ විවාහක, ප්‍රජනන වයසේ පසු වන කාන්තාවන් වන අතර වසර දෙකක් හෝ ඊට වඩා වැඩි කාලයක් ඔවුන් නිවසින් බැහැරව සිටීම නිසා එම පවුල් වල උපත් සංඛ්‍යාව අඩු වීම මුළු සාපල්‍යතා අනුපාතය පහල බැසීම කෙරෙහි බලපානු ලබයි. මීට අමතරව රටක ජනගහනය අඩු කිරීම සඳහා බලපාන තවත් සාධකයක් වන්නේ ජාත්‍යන්තර ශුද්ධ සංක්‍රමණයන්ය. විශාල වශයෙන් කාන්තාවන් මැද පෙරදිගට සංක්‍රමණය වීම නිසා 1975 සිට 1995 පමණ දක්වාම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ශුද්ධ සංක්‍රමණ සෘණ අගයක් ගත් අතර මෙය රටේ ජනගහන වර්ධනය අඩු වීමට හේතු වූ එක් සාධකයක් විය. සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය අඩු කිරීම සඳහා විවිධ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක

කරනු ලබන අතර ජාත්‍යන්තර කාන්තා ශ්‍රම සංක්‍රමණය රජයේ මෙම උත්සාහය සාර්ථක කර වීම කෙරෙහි අනුබල දක්වයි.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණය 70 දශකයේ අග භාගයේ සිටම සීඝ්‍රයෙන් ඉහල යමින් පවතින අතර එහි සමාජ ආර්ථික ප්‍රතිලාභ සුවිශේෂී ලෙස කැපී පෙනෙන්නක් වේ. එය රටේ ආර්ථිකය සඳහා මූල්‍යමය වශයෙන් ධනාත්මක බලපෑමක් සිදු කරනු ලබයි. මෙසේ සංක්‍රමණික කාන්තාවන් මඟින් විදේශ විනිමය රටට ඇද ගැනීමෙන් රජය විශාල ආර්ථික ලාභයක් ලබයි. එබැවින් කාන්තා රැකියාව සඳහා පවතින විකල්ප අතුරින් එක් විකල්පයක් වශයෙන් සංක්‍රමණය සඳහා කාන්තාවන් දිරිමත් කළ හැකිය. එහිදී ආර්ථික විශේෂඥයින්, සමාජ විද්‍යාඥයින් ආදී විද්වතුන් විසින් කාන්තා ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ තක්සේරු කර නිගමනයකට පැමිණීම වඩා උචිත ක්‍රමයකි.

මැද පෙරදිග ශ්‍රමය සඳහා සංක්‍රමණය වන කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් වල සුභසාධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග පවතින තත්ත්වයට වඩා ඉහල මට්ටමකින් සිදු කළ යුතු අතර ඒවා සාර්ථකව ක්‍රියාත්මක වන්නේදැයි නිරන්තර ඇගයීමට ලක් කළ යුතුය. මීට අමතරව තානාපති කාර්යාලවල සුභසාධන කටයුතු මීට වඩා කාර්යක්ෂමව කළ යුතු අතර ම බහුතර ගෘහ සේවිකාවන්ට නිවාඩු දිනයක් වන සිකුරාදා දිනයේ තානාපති කාර්යාල විවෘතව තැබීම වඩා සුදුසු යැයි යෝජනා කෙරේ.එයට හේතුව වන්නේ තානාපති කාර්යාලයෙන් ඉටු කරවා ගත යුතු කාර්යන් සඳහා ශ්‍රී ලාංකික කාන්තාවන්ට තම නිවාඩු දිනය භාවිතා කළ හැකි බැවිනි. මීට අමතරව සංක්‍රමණික කාන්තාවන්ගේ දරුවන් සඳහා රජයේ මැදිහත් වීමෙන් රැක බලා ගැනීමේ ස්ථාන හෝ දාරකාගාර මනා පරිපාලනයකින් යුතුව ක්‍රියාත්මක කිරීම වැදගත් ය.එම දාරකාගාර සඳහා සහනදායි ගෙවීම් ක්‍රමයක් යටතේ යම්කිසි මාසික කුලියක් අය කරගෙන එම මුදලින් සදක්‍රමණික කාන්තාවන්ගේ දූ දරුවන්ට වඩා හොඳ පහසුකම් ලබා දිය හැකිය.

මෙලෙස ශ්‍රමය සඳහා විදේශ ගතවන පිරිස ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස එතරම් විශාල නැත. එය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 1ක් පමණ වන අතර ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.7කි. මේ අතුරින් විදේශ ගතවන කාන්තාවන් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 2කි. මේ නිසා ශ්‍රී ලංකාවේ සමස්ථ කාන්තා රැකියා නියුක්තිය කෙරෙහි විදේශ ගතවන කාන්තාවන් ප්‍රමාණයේ බලපෑම ඉතා අඩුය. (මෙදියස් 2001) එම තත්ත්වය තුළ විදේශ රැකියා සඳහා තව තවත් දිරිමත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම තුළ මෙරට ආර්ථික ප්‍රතිලාභ වඩාත් ඉහල නංවා ගැනීමට හැකිවනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

සංක්‍රමණිකයන් පිළිබඳ සංඛ්‍යා අත් පොත් විවිධ කලාප ප්‍රකාශන අංශය, විදේශ සේවා නියුක්ති කාර්යංශය, කොළඹ

මේදියස් ජේ. (2005) සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින්, ජන පුවත්,පස්වැනි වෙළුම, ජනගහන අංශය, සෞඛ්‍ය අමාත්‍යංශය, කොළඹ

කාන්තා පර්යේෂණ කේන්ද්‍රය (1999), ස්ත්‍රී ප්‍රබෝධ, 11 වැනි වෙළුම අංක, 1 ජූනි කලාපය

Lee, E. (1969) “A theory of Migration”, Migration, Ed J. Jackson, Cambridge: Cambridge university press, 282-297

United Nation (2002), Human Rights; “A compilation of international Instruments” Vol.New York and Geneva